# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 64 — 1973 ජූනි 14 වැනි සිකුරාදා — 1973.06.14

ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී


# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | 583 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | 587 |
| සභාපති—ඇමැතිතු ... ... ... | 584 | අය—වැය ලේඛන ... ... ... | 592 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 586 | දේපල විකිණීම් ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | 587 | මාර්ග කොන්ත්‍රාත් දැන්වීම් ... ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... | — | විවිධ දැන්වීම් ... ... ... | 593 |


සැලකිය යුතුයි.—ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයෙහි යෙදීම් පිළිබඳ (සංශෝධන) පනතේ කෙටුම්පත 1973 ජූනි 08 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

## පළාත් පාලන නිවේදන

### ගම්සභා ආඥාපනත

13 වෙනි වගන්තිය යටතේ දැන්වීම

1961 අංක 60 දරණ පනතින් සංශෝධිත ගම්සභා ආඥාපනතේ (257 අධිකාරය) 13 (1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කොළඹ දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් ගන්හේවාගේ දයානන්ද ද සිල්වා වන මම කෙහෙල්ඇල්ල—ගම් සභාවේ අංක 12 දරන කොට්ඨාශයේ නියෝජිත ලොකු බාලසූරිය අප්පුහාමිලාගේ ධර්මසේන මහතා සභාවට දැන්වීමක් නොමැතිව පිළිවෙලින් සභා රැස්වීම් වාර තුනකට වැඩි ගණනකට තමා තෝරා පත්කර ගැනීමෙන් පසු නොපැමිණි බව ගැන සෑහීමකට පත්ව කොළඹ දිස්ත්‍රික්කයේ කෙහෙල්ඇල්ල ගම්සභාවේ අංක 12 දරන කොට්ඨාශයේ නියෝජිත ලොකු බාලසූරිය අප්පුහාමිලාගේ ධර්මසේන මහතා මේ දැන්වීම් ගැසට් පත්‍රයේ පළකිරීමේ දිනයේ සිට සිය ධුරය හිස්කර ඇති බව මෙයින් ප්‍රකාශ කරමි.

ග. දයානන්ද ද සිල්වා,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
කොළඹ දිසාව.

1973. 05. 30 දින,
කොළඹ දිසාවේ, පළාත් පාලන සහකාර,
කොමසාරිස් කාර්යාලයේ දී ය.

6–475—73.06.14 දින අංක 64 දරණ ගැසට් පත්‍රය

---

### ගම්සභා ආඥාපනත

13 වෙනි වගන්තිය යටතේ දැන්වීම

1961 අංක 60 දරණ පනතින් සංශෝධිත ගම් සභා ආඥාපනතේ (257 වෙනි අධිකාරය) 13 (1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලයේ ප්‍රකාර කුරුණෑගල දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් සිටිසාම් මුදියන්සේලාගේ හේරත් බණ්ඩා වන මම මූරුතැන්ගේ ගම් සභාවේ අංක 6 මූරුතැන්ගේ ඉහලගම කොට්ඨාශයේ නියෝජිත වාසල මුදියන්සේලාගේ චන්ද්‍රසේකර වත්තේගෙදර මහතා සභාවට දැන්වීමක් නොමැතිව පිළිවෙලින් සභා රැස්වීම් වාර තුනකට වැඩි ගණනක් තමන් තෝරා පත් කර ගැනීමෙන් පසු නොපැමිණි බව ගැන සෑහීමට පත්ව කුරුණෑගල දිස්ත්‍රික්කයේ මූරුතැන්ගේ ගම් සභාවේ අංක 6 මූරුතැන්ගේ ඉහලගම කොට්ඨාශයේ සභික වාසල මුදියන්සේලාගේ චන්ද්‍රසේකර වත්තේගෙදර මහතා මේ දැන්වීම ගැසට් පත්‍රයේ පළ කිරීමේ දිනයේ සිට සිය ධුරය හිස් කර තිබෙන බව මෙයින් ප්‍රකාශ කරමි.

එච්. ඇම්. එච්. බණ්ඩා,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
කුරුණෑගල.

1973 මැයි මස 30 වෙනි දින,
කුරුණෑගල පළාත් පාලන කාර්යාලයේ දීය.

6–446—73.06.14 දින අංක 64 දරණ ගැසට් පත්‍රය

---

සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

### විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් භාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම මුලවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව ලමනී ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාද වී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.

1973 ජනවාරි 7 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

### ගම් සභා ආඥාපනත

13 වෙනි වගන්තිය යටතේ දැනුම් දීම

1961 අංක 60 දරණ ගම් සභා (සංශෝධන) පනතින් සංශෝධිත (257 වෙනි අධිකාරය) ගම් සභා ආඥාපනතෙහි 13 (1) වෙනි වගන්තියෙන් මා වෙත පවැරුනු බලතල ප්‍රකාර ත්‍රිකුණාමලයේ පළාත් පාලන සහකාර කොමසාරිස් බර්ට්‍රම් ආරනෝල්ඩ් ජෙයරාජා කාසිනාදර් වන මම, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ අග්බෝපුර ගම් සභාවේ අංක 5 කොට්ඨාසයේ නියෝජිත ලියනගේ ධනපාල කීර්තිසේන පෙරේරා මහතා සභාවට දැන්වීමක් නොමැතිව පිළිවෙළින් රැස්වීම් තුනකට වැඩි වාර ගණනකට තමන් තෝරා පත්කර ගැනීමෙන් පසුව නොපැමිණි බව ගැන සෑහීමකට පත්ව, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ අග්බෝපුර ගම් සභාවේ අංක 5 කොට්ඨාසයේ නියෝජිත ලියනගේ ධනපාල කීර්තිසේන පෙරේරා මහතා මෙම දැන්වීම ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළකිරීමේ දිනයේ සිට තම සභිකත්වය අත්හරින ලද බව මෙයින් ප්‍රකාශ කරමි.

බී. ඒ. ජේ. කාසිනාදර්,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
ත්‍රිකුණාමලය.

පළාත් පාලන දෙපාර්තමේන්තුව,
ත්‍රිකුණාමලය,
1973 මැයි මස 29 වෙනි දින දී ය.

6–452—73.06.14 දින අංක 64 දරණ ගැසට් පත්‍රය

---

# තනතුරු ඇබෑර්තු

## ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයෙහි IV වැනි කොටසෙහි පළ කෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි

1. **දීමනා.**—රජයේ නිලධාරීන්ට අදළ වන ප්‍රමාණයන් හා කොන්දේසි අනුව විවාහක දීමනාවක් ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී 1969 අංක 18 දරණ පළාත් පාලන සේවා පනතට හා පළාත් පාලන සේවා රෙගුලාසිවලටත්, කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරනු ලබන අනිකුත් සේවා කොන්දේසිවලටත් යටත් වෙයි.

3. **සේවය භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(අ) පළාත් පාලන සේවයේ මාසික වැටුප් ගෙවනු ලබන තනතුරුවලට පත්කරනු ලබන සියලු දෙනාම, පළාත් පාලන සේවා අර්ථසාධක අරමුදලට දායක වනු ඇත. මෙම අරමුදලට සේවකයා විසින් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් සියයට 6 ක් දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය. අදළ නිලධාරි තැනගේ ඒකාබද්ධ වැටුපෙන් සියයට 9 ක් ඔහු සේවය කරනු ලබන ප්‍රාදේශීය බලමණ්ඩලය විසින් ඔහු වෙනුවෙන් ගෙවනු ලැබේ.

(ආ) ආණ්ඩුව යටතේ සේවය කරන නිළධාරීන්, ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 21 වන වගන්තිය යටතේ සේවයෙන් මුදා හරිනු ලැබ, පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මාරුකරනු ලැබුවහොත්, ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ආරක්‍ෂාවේ. පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන නිළධාරියෙකු එම සේවයේ විශ්‍රාම වැටුප් සහිත වෙනත් තනතුරකට පත්කරන ලද්දේ නම් හෝ උසස් කරන ලද්දේ නම් ඔහු සිය නව තනතුරෙහිද විශ්‍රාම වැටුප් හිමිකම් තවදුරටත් භුක්ති විඳිනු ඇත.

(ඇ) ප්‍රාදේශීය බලමණ්ඩලවල විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථාවේ නියෝග හෝ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරන සේවකයන් සම්බන්ධයෙන් වූ විට, ඔවුන් අවසානයේදී සේවයෙන් විශ්‍රාම ගැනීමේදී ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම තීරණය කරනු ලබන්නේ, 1969 අංක 18 දරන පළාත් පාලන සේවා පනත ප්‍රකාර, පළාත් පාලන සේවයට මාරුකරනු ලැබූ දිනයට කලින් ද ඔවුන් සේවයේ යෙදී සිටි ප්‍රාදේශීය බලමණ්ඩලයෙහි විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හා නියෝග අනුවය.

(ඈ) පළාත් පාලන සේවයේ මාසික වැටුප් ගෙවනු ලබන තනතුරු වලට පත්කරනු ලබන නිළධාරීන්ට වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය අදළ නොවනු ඇත. එහෙත්, ස්ත්‍රීන්ද, වයස අවුරුදු 55ට වැඩි නිළධාරීන්ද, පළාත් පාලන සේවයට පත්කරන ලද දිනයට පෙර, ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දැරූ නිළධාරීන්ද හැර, පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක සිට වෙනත් විශ්‍රාම වැටුප් සහිත තනතුරකට උසස් කරන හෝ පත්කරන ලද සියලු දෙනාටම 1952 ජූනි 30 වන දින හා 10,329 වැනි අංකය දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළකරන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසි යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට ස්වකීය අනුමාන මූලික වැටුපෙන් සියයට 4 ක මුදලක් ගෙවීමට නියම කරනු ලැබේ. ප්‍රාදේශීය බලමණ්ඩලය විසින් ඒ ඒ නිළධාරියාගේ අනුමාන මූලික වැටුපෙන් සියයට 3 දායක මුදලක් ගෙවනු ලැබේ.

(ඉ) ප්‍රාදේශීය බලමණ්ඩලය විසින් නියම කරනු ලබන මුදලක්, මුලින්ම හෝ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඇපකාර සමාගමක් මගින් ඉදිරිපත් කරන විශ්වාස සහතික ඇප ඔප්පුවක් මගින් හෝ ඇප තබන ලෙස මේ තනතුරුවලට පත්වන්නන්ට නියම කළ හැකිය.

(ඊ) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම පළාත් පාලන සේවයට අයත් උපලේඛනගත තනතුරු නොදරන්නන්ට දිවයිනේ කවර පෙදෙසක වුවද සේවය කිරීම සඳහා ශාරීරික වශයෙන් ඔවුන් සුදුසු ද නැද්ද යනු, පරීක්ෂා කිරීම පිණිස සුදුසුකම් ලත් වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

(උ) අන්‍යාකාරයකින් නියමකොට නැති කල්හි සාමාන්‍යයෙන් පත්වීම් අවුරුදු තුනක ආධුනික කාලයකට හෝ අවුරුදු තුනකින් පසු ස්ථිර කරනු ලැබීමට හෝ යටත් වෙයි.

(ඌ) අයදුම්කරුවන් නියම කරනු ලැබූ අවස්ථාවක ඔවුන්ගේ උප්පැන්න සහතික හෝ අනුමාන වයස පිළිබඳ සහතික ඉදිරිපත් කිරීමට සූදානම් වී සිටිය යුතුයි.

(එ) පත් කරනු ලබන අය දිවයිනෙහි ඕනෑම පෙදෙසක සේවය කළ යුතුය.

4. **පළාත් පාලන සේවයට නව ප්‍රවේශක නිලධාරීහු.**—(i) අදල පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත්කරනු ලැබූ නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය යම්කිසි තනතුරු වෙනුවෙන් වඩා දීර්ඝ කාලයක් නියමකොට නැත්නම් අවුරුදු 3 ක් වන්නේය.

(ii) 1956 අංක 33 දරණ රාජ්‍යභාෂා පනතේ විධිවිධානවලටත්, ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා දැනට පවත්නා වූත් හෝ මින්මතු සම්පාදනය කළ හැකි වූ කිසියම් නියෝග හෝ නීතිරීතිවලට එකඟවීමේ කොන්දේසියට සියලුම නව ප්‍රවේශක නිලධාරීන් එකඟ විය යුතුය.

(iii) රාජකාරී කටයුතු කාර්යක්ෂම ලෙස ඉටුකිරීමෙහිලා අත්‍යවශ්‍ය නොවන්නාවූ විශෙෂ අවස්ථාවන්හිදී හැර, ඔවුන් ස්වකීය ආධුනික/වැඩ පරීක්ෂණ කාලපරිච්ඡෙදය ඇතුළත රාජ්‍ය භාෂාව වන සිංහලෙන් වැඩ කිරීමේ දැනුමක් ලබාගත යුතුය.

(iv) ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂණ කාලය අවසානයේදී පත්වීම ස්ථිර කිරීම, අනිකුත් කරුණු අතර, නියමිත කාලසීමාව තුළදී කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර තත්ත්වයට වඩා ඉහළ නොවන මට්ටමක් දක්වා වූ සිංහල පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත්වීම උඩ රඳා පවතී. නියමිත කාලසීමා ඇතුළත දී මෙම පරීක්ෂණවලින් අසමත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් එසේ නියමිත පරීක්ෂණවලින් සමත්වනතුරු නියමිත වැටුප් වැඩිවීම් නොගෙවනු ලබන අතර, ස්වකීය ආධුනික කාලය/වැඩ පරීක්ෂණ කාලය අවසාන වනවිට, සිංහල ප්‍රවීනතාවය පිළිබඳ නියමිත තත්ත්වය ලබා ගැනීමට අසමත් වන නිලධාරීන්ගේ සේවය අවසන් කරනු ලැබිය හැකිය.

(v) **අධ්‍යාපනික සහ අනිකුත් සුදුසුකම්.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ ඊට උසස් විභාගයකින් හෝ සාමාර්ථ්‍යය අඩුම සුදුසුකම වශයෙන් නියමකොට ඇත්තා වූ සෑම බඳවා ගැනීමේ ක්‍රියා පරිපාටියකදීම සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයෙකු වන අයදුම්කරුට ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් ලබන ලද සිංහල භාෂාව පිළිබඳ හෝ ඊට සමාන විෂයකින් සම්මානයක් තිබිය යුතුය.

(1963 පෙබරවාරි මස 8 වැනි දිනට පූර්ව වූ දිනයක සිට පළාත් පාලන සේවයේ සිටියා වූත්, පළාත් පාලන සේවයේ වෙනත් තනතුරු ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් කෙරෙහි මේ අවශ්‍යතාව අදල නොවේ.)

**සටහන.**—(i) පළාත් පාලන සේවයට ඇතුලුවීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබාගන්නා අය තනතුරු ස්ථිර කිරීම සඳහා පූර්ව අවශ්‍යතාවයක් වශයෙන් වූ සිංහල ප්‍රවීණතා පරීක්ෂණ සමත්වීමෙන් නිදහස් කරනු ලැබේ.

(ii) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා "නව ප්‍රවේශක" යන පදය අදල වනුයේ 1960.1.29 දින හෝ ඊට පසුව ප්‍රසිද්ධ කරන ලද ගැසට් නිවේදන අනුව පළාත් පාලන සේවයේ තනතුරුවලට පළමුවරට පත්කරනු ලබන නිලධාරීන්ටය.

(iii) රජයේ සේවයෙහි නියැලිව සිට, පළාත් පාලන සේවයේ තනතුරු භාරගැනීම සඳහා සේවයෙන් නිදහස් කරනු ලබන්නාවූ "ආදී ප්‍රවේශක නිලධාරීන්" කෙරෙහි ඉහත 4 වැනි ඡේදයේ (iii) හා (iv) දරණ ඡේදවල සඳහන් විධිවිධාන අදල නොවේ.

5. සෑම අයදුම්කරුවෙකු විසින්ම, තමා ලාංකිකයකු බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි. "ලාංකිකයා" යනු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියෙකු වූවෙකි.

6. **සේවාමුක්ත හටයින් සඳහා අනුග්‍රහ.**—(අ) සේවාමුක්ත වූ අයදුම්කරුවනට, ඔවුන්ගේ නිත්‍ය හට හමුදා සේවා කාලය, තම වයසින් අඩුකර ගැනීමෙන්, ඉල්ලුම්කර ඇති තනතුරුවල නියමිත උපරිම වයස් සීමාව ඇතුළට පැමිණිය හැකිවන අවස්ථාවක නිත්‍ය හට සේවා කාලපරිච්ඡෙදය එසේ අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

(ආ) සේවයේ යම්කිසි තනතුරක් සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය නියමිත අඩුම අධ්‍යාපන සුදුසුකම, ඊළඟට පහළින් ඇති විභාගය දක්වා අඩු කිරීමට සේවාමුක්තයන් වන අයදුම්කරුවනට අවසර දෙනු ලැබේ.

7. **වයස පිළිබඳ අනුග්‍රහය.**—පළාත් පාළන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළකෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකා අයදුම්පත් එවීමට ස්ථිර තනතුරක් දරණ, වර්ෂ දෙකක අඛණ්ඩ සේවාක් ඇති ප්‍රාදේශීය බලමණ්ඩලයන්හි සේවකයන්ට පුළුවන.

8. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට පළාත් පලාන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන් අයදුම්පත් තම තමන් සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩල සභාපති මගින් හෝ නාගරික කොමසාරිස්වරයා මගින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දැනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලාධරීන්ගේ අයදුම් පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙනි. ආණ්ඩුවේ සේවයේ ස්ථිර තනතුරු දරණ නිලධාරීන් එවන අයදුම් පත් ඉදිරිපත් කිරීමේ දී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම්කරුවන් තෝරාගනු ලැබුවහොත්, ඔවුන් ස්වකීය තනතුරුවලින් මුදවන්නට තමන් සූදානම්ව සිටිද්ද නැද්දයි සඳහන් කළ යුතුය.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයනට නියම කරනු ලැබිය හැකිය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක්, අන්කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iv) කිසිම අපේක්ෂකයෙකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම්, එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයෙකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයක් ලබාගැනීමකට හෝ බලපැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත්, ඒ හේතුවෙන්ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන්කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම්, ඒ හේතුවෙන්ම එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුනි නම්, රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) පහත සඳහන් ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සළකා බලනු නොලැබේ. අයදුම්පතක් තැපැලේදී ප්‍රමාද වූ බවට හෝ නැති වූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු ස්වකීය අයදුම්පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ තුමූම ඒ අවදානමට මුහුණ පාති.

**අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම් පත් ආකෘතිය**

පළාත් පාලන සේවය

සැ. යු.—(i) අයදුම් පත්‍ර පහත සඳහන් ආකෘතියෙහි පිළියෙලකොට තනතුරු අදාළ වන ගැසට් නිවේදනයෙහි සඳහන්, අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු, කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම් පත්‍ර ලේකම්ගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැළකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදාළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවන් වග බලාගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල සිටපත්, අයදුම්කරුවන් ස්වකීය අයදුම් පත්‍රවලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රීසි, සිංහල, දෙමළ යන භාෂාවලින් සමත්වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය. (2) චරිත සහතිකය. (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදාළවන වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැලකිල්ල යොමු කරන්න.

**——————තනතුර සඳහා වූ අයදුම් පත**

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය :————.
(ආ) ඉල්ලුම්කර සිටින තනතුර :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.
ජාතිය :————.
(එම ලියාපදිංචිවීමෙන් ලාංකිකයෙකු වී නම්, පුරවැසිභාවය පිළිබඳ සහතිකයේ දිනයත්, සැඳහුම් අංකයත් සඳහන් කරන්න.)

3. තැපැල් ලිපිනය :————.
(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයට නියම වයස :—
අවුරුදු :————. මාස :————. දින :————.
(ආ) උපන් දිනය :—

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—
(අ) අයදුම්කරු :————.
(ආ) අයදුම්කරුගේ පියා :————.
(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.
(ඈ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :————.
(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ), (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඈ) සහ (ඇ) පිරිවිය යුතුය.)

6. විවාහක ද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

සාමාන්‍ය අධ්‍යාපනය

| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය

| විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපනික සුදුසුකම් :
(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය/අ.පො.ස. (සාමාන්‍ය පෙළ)—

| | සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සම්මාන/විශිෂ්ය සාමාර්ථය |
|---|---|---|---|---|
| පළවෙනි වාරය | | | | |
| දෙවැනි වාරය | | | | |

(ආ) අ.පො.ස. (උසස් පෙළ)—

| සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සම්මාන/විශිෂ්ය සාමාර්ථය |
|---|---|---|---|
| | | | |

(ඇ) වෙනත් උසස් අධ්‍යාපනික සුදුසුකම්—

| විභාගයේ නම | සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් |
|---|---|---|---|
| | | | |

(ඇ) සමර්ථ වී ඇති උසස්ම විභාගය :—

(i) සිංහල :————.

(ii) දෙමළ :————.

(iii) ඉංග්‍රීසි :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ ශිල්පීය සුදුසුකම් ලැබූ දින හා ආයතනවල නම් :————.

10. වෘත්තීය/කාර්මික/කර්මාන්ත පළපුරුද්ද :—

| ආයතනයේ නම | ආධුනිකත්වයේ ස්වභාවය දරූ තනතුර | සිට | දක්වා |
|---|---|---|---|
| | | | |

(සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි)

11. (අ) පාඨශාලාවෙන් අස් වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයන් හා අස් වූ දිනයන් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න) :————.

(ආ) මීට පළමු, ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් හෝ රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු) පළාත් පාලනායතන හා කාල සීමාවන් :————.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත් වූ දිනය :————.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද ? :————.

(ඉ) සේවා මුක්ත හටයෙක් නම්—සේනාංකය, තරාතිරම, සේවයට බැඳුන දිනය හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කථා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :—

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. විශේෂ සුදුසුකම්.—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම්, ඒ පිළිබඳව සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද, එසේ නම් දිනය, නඩු අංකය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස්ද ? එසේ නැත්නම්, ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කෙතෙක් ද ? :————.

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————.

(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව, පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ.)

මේ අයදුම් පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත්, මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්,
තැ. පෙ. 530, කොළඹ 1.

---

## පළාත් පාලන සේවය

### කාර්යාල කාර්ය සහායක තනතුර — ගල්ගමුව ගම් සභාව

ඉහත සඳහන් තනතුර සඳහා මා විසින් අයදුම් පත් කැඳවනු ලැබේ.

2. වැටුප් ක්‍රමය.—රු. 540—30×18—24×1—රු. 804 කි. රු. 636 සහ රු. 732 යන වාර්ෂික වැටුප් වැඩිවීම් ගෙවීමට පළමු කාර්යක්ෂමතා කඩයිම් ඇත. මෙම වැටුප් ක්‍රමය ඒකාබද්ධ වැටුප් ක්‍රමයට පරිවර්තනය කිරීමට යටත් වේ. තනතුර ස්ථිරය. වර්ෂ තුනක ආධුනිකත්ව සේවා කාලයට යටත් ය. තෝරාගන්නා අයදුම්කරු සේවක අර්ථසාධක අරමුදලේ දායකයෙකු විය යුතුය.

3. සුදුසුකම් :

(අ) 1973 ජූලි මස 2 වැනි දිනට වයස අවුරුදු 20 නොඅඩු හා 30 නොවැඩි විය යුතුය.

(ආ) අපේක්ෂකයින් සිංහල 8 වැනි ප්‍රමාණය හෝ ඊට උසස් විභාගයකින් සමත් වී සිටිය යුතුය.

(ඇ) අපේක්ෂකයින් ගල්ගමුව ගම්සභා ප්‍රදේශයේ දැනට ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.

(ඈ) කාර්යාල කාර්ය සහායක සේවයේ පළපුරුද්ද විශේෂ සුදුසුකමක් වනු ඇත.

4. මෙම ගැසට් පත්‍රයේ ආරම්භයේ පළකර ඇති පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන කොන්දේසි සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි බලනු මැනවි.

5. ඉහත සඳහන් පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරගත් අයදුම් 1973 ජූලි මස 02 දින හෝ ඊට පෙර ලැබෙන සේ ගල්ගමුව ගම්සභාවේ සභාපතිතුමා වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

විමල් මඩදොඹේ,
ගල්ගමුව ගම්සභාවේ සභාපති.

1973. 06. 06 දින,
ගල්ගමුව ගම්සභා කාර්යාලයේ දී ය,
ගල්ගමුව.

6–659—73.06.14 දින අංක 64 දරණ ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## පළාත් පාලන සේවය

### වෘත්තීය සුදුසුකම් නොලත් සහකාර ඉංජිනේරු ශ්‍රේණියට (සිවිල්) උසස් කිරීමේ විභාගය—1971

### මැණීම — මට්ටම් කිරීම II ප්‍රායෝගික

ඉහත සඳහන් විභාගයේ ප්‍රතිඵල පහත සඳහන් වේ :—

| විභාග අංකය | නම | සමත් වූ විෂයයන් |
|---|---|---|
| 1. 1092 ... ... ... | එස්. ඊ. ජෙයරාජා ... ... | 1. මැණීම II<br>2. මට්ටම් කිරීම II |
| 2. 1094 ... ... ... | ඇස්. කුලසිංහම් ... ... ... | 1. මැණීම II<br>2. මට්ටම් කිරීම II |
| 3. 1101 ... ... ... | කේ. සිවසුන්දරම් ... ... ... | 1. මට්ටම් කිරීම II |

1973 මැයි මස 31 දින,
තැ. පෙ. 530,
කොළඹ.

එඩ්ගා ප්‍රනාන්දු,
ලේකම්,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව.

6–480—73. 06 .14. දින අංක 64 දරන ගැසට් පත්‍රය

# අතුරු ව්‍යවස්ථා

### නාරම්මල සුළු නගර සභාව

#### සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 152 වැනි සහ 156 වැනි වගන්ති යටතේ නාරම්මල සුළු නගර සභාව විසින් පනවනු ලැබ එකී ආඥාපනතේ 153 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

ගා. බෙ. වික්‍රමනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1973, මැයි මස 15 වැනි දින.

#### අතුරු ව්‍යවස්ථා

#### රථවාහන හා සතුන් පිළිබඳ බද්ද

සභාව විසින් පිළිගන්නා ලද සම්මත අතුරු ව්‍යවස්ථාවල XXII වැනි කොටසෙහි 3 වෙනි අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා භාගත වෙන්කොට දැක්වීමේ අකුරු පහත සඳහන් පරිදි විය යුතුය.

මෝටර් රථයක්, රෝද තුනේ මෝටර් රථයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, අත් කරත්තයක්, ජින් රික්ෂෝ රථයක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හැර අනිකුත් හැම රථ වාහනයක් සඳහා : නා. සු. වා.

හැම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාර් එකක් හෝ කරත්තයක් හෝ ට්‍රයිසිකලයක් හෝ කරත්තයක් සඳහා—

(අ) වෙළඳ කාර්යයන් සඳහා පාවිච්චි කරනු ලැබේනම් : නා. සු. වෙ. පා.

(ආ) වෙළඳ කටයුතුවලින් බාහිර වූ වෙනත් කටයුතු සඳහා පාවිච්චි කරනු ලැබේනම් : නා. සු. පා.

හැම බර කරත්තයක් සඳහාම : නා. සු. බ. ක.

හැම බර බාග කරත්තයක් සඳහාම : නා. සු. බා. ක.

හැම අත් කරත්තයක් සඳහාම : නා. සු. අ. ක.

හැම ජින් රික්ෂෝ රථයක් සඳහාම : නා. සු. ජි.

මේ කාරණය සම්බන්ධයෙන් 1968. 12. 20 දින අංක 14,833 දරණ ගැසට් පත්‍රයේ පළවූ අතුරු ව්‍යවස්ථාව මෙයින් අවලංගු කරනු ලැබේ.

6-628 —73. 06. 14 දින අංක 64 දරණ ගැසට් පත්‍රය

---

#### ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 42 වැනි වගන්තිය යටතේ මාතලේ දිස්ත්‍රික්කයේ ලග්ගල පල්ලේසිය පත්තුව ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්පාදිතව, ඒ වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

ගා. බෙ. වික්‍රමනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1973. 05 26
කොළඹ දීය.

#### අතුරු ව්‍යවස්ථා

ගම්සභාව විසින් සම්මත කරගන්නා ලද අතුරු ව්‍යවස්ථාවල XXVIII වැනි කොටසෙහි දැක්වෙන ජලසම්පාදන සේවය පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා, ලග්ගල පල්ලේසිය පත්තුව ගම් සභාවට අදාලවන තාක් දුර එහි 27(2) වැනි අතුරු ව්‍යවස්ථාවට ඉක්බිතිවම පහත සඳහන් ඡේදය අන්තර්ගත කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(3) සභාව විසින් පිහිටුවනු ලැබූ ජල සම්පාදන සේවයෙන් යම් ස්ථානයකට පුද්ගලික ජලනලයක් සවිකර දෙනු ලැබූ යම් ස්ථානයක අයිතිකරු හෝ පදිංචිකරු වෙත යථා පරිදි දැන්වීමක් භාරදෙනු ලැබූ විට, ඒ ස්ථානයෙහි වූ පළමුවැනි අඟල් භාගයේ කරාමයෙන් ජලය යම් ව්‍යාපාරයක කාර්‍ය සඳහා පාවිච්චි කරනු ලබන අවස්ථාවක ඒ වෙනුවෙන් ඔහු විසින් රුපියල් දෙකයි ශත පණහක් වූ ගාස්තුවක් ද යම් ගෘහ කාර්‍යයක් සඳහා පාවිච්චි කරනු ලබන අවස්ථාවක ඒ වෙනුවෙන් රුපියල් එකක් වූ ගාස්තුවක් ද, අමතර හැම කරාමයක් වෙනුවෙන්ම ශත පණහක් වූ ගාස්තුවක් ද, එකී ජල සම්පාදන සේවයෙන් ජලය ලබාගන්නා හැම මාසයක් සම්බන්ධයෙන්ම ගෙවිය යුතුය.

6-623—73. 06. 14 දින අංක 64 දරණ ගැසට් පත්‍රය

---

# ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන

### අම්බලන්ගොඩ නගරය

#### 1972 දෙසැම්බර් මස 31 දිනට ශේෂ පත්‍රය

| බැරකම් | සාමාන්‍ය රු. ශ. | විදුලිය රු. ශ. | එකතුව රු. ශ. |
|---|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම් | | | |
| ශේෂය ඉ/ගෙ. (1972.11.30) ... | 69,417 35... | 8,512 10... | 77,929 45 |
| දීර්ඝ කාලීන බැරකම් | | | |
| දීර්ඝ කාලීන ණය ගිණුම | 80,300 0... | — ... | 80,300 0 |
| සංචිත හා වෙන්කිරීම් | | | |
| තැන්පත් ගිණුම් ... | 42,765 31... | 79,411 59... | 1,22,176 90 |
| ක්ෂයවීම් සඳහා වෙන්කිරීම් | — ... | 24,720 36... | 24,720 36 |
| වැය නොකළ මුදල් | | | |
| වැය නොකළ ණය ගිණුම | 25,033 0... | — ... | 25,033 0 |
| වැය නොකළ ආධාර ගිණුම | 5,930 65... | — ... | 5,930 65 |
| ජංගම බැරකම් | | | |
| විවිධ ණය හිමියෝ ... | 44,867 10... | — ... | 44,867 10 |
| ලංකා විදුලිබල මණ්ඩලය | — ... | 38,791 08... | 38,791 08 |
| අතිරික්ත හා ඌනතා ගිණුම ... | 5,11,984 96... | 1,42,517 09... | 6,54,502 05 |
| | 7,80,298 37 | 2,93,952 22 | 10,74,250 59 |

| වත්කම් | සාමාන්‍ය රු. ශ. | විදුලිය රු. ශ. | එකතුව රු. ශ. |
|---|---|---|---|
| ස්ථාවර වත්කම් | | | |
| ප්‍රාග්ධන වත්කම් ... | 69,417 35... | 8,512 10... | 77,929 45 |
| ණය යෝජනා ක්‍රම ... | 2,31,500 0... | — ... | 2,31,500 0 |
| ආයෝජන | | | |
| ස්ථිර තැන්පත් ගිණුම ... | 65,492 14... | — ... | 65,492 14 |
| ජංගම වත්කම් | | | |
| ගබඩා අත්තිකාරම් ගිණුම | 18,918 57... | 34,567 82... | 53,486 39 |
| විවිධ ණය ගැතියෝ ... | 64,093 25... | 7,150 0... | 71,243 25 |
| වරිපනම් බදු ගිණුම ... | 1,33,815 54... | — ... | 1,33,815 54 |
| වරෙන්තු ගාස්තු ගිණුම ... | 26,513 11... | — ... | 26,513 11 |
| විදුලි ගාස්තු ගිණුම ... | — ... | 1,06,646 84... | 1,06,646 84 |
| ගෙවල් කුලී ගිණුම ... | 107 97... | — ... | 107 97 |
| මහජන වෙ.පො.බ. ගිණුම | 913 13... | — ... | 913 13 |
| අත්තිකාරම් ගිණුම ... | 1,27,671 56... | 2,929 70... | 1,30,601 26 |
| මුදල් හා බැංකු ගිණුම ... | 41,855 75... | 1,34,145 76... | 1,76,001 51 |
| | 7,80,298 37 | 2,93,952 22 | 10,74,250 59 |

අම්බලන්ගොඩ නගරයේ විශේෂ කොමසාරිස් කෝලිත වල්ගමගේ වන මම, මෙහි ඉහත සඳහන් අම්බලන්ගොඩ නගර සභාවේ 1972 දෙසැම්බර් 31 වන දිනට ශේෂ පත්‍රය මගේ සම්පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට නිවැරදිවූත්, සත්‍යවූත් ප්‍රකාශයක් බව මෙයින් සහතික කරමි.

ඉහත කී වාර්තාව නිවැරදි බවට සහතික කරමි.
එල්. එච්. එල්. රණසූරිය,
ලේකම්.

කේ. වල්ගමගේ,
විශේෂ කොමසාරිස්, අම්බලන්ගොඩ නගරය.

අම්බලන්ගොඩ විශේෂ කොමසාරිස් කාර්‍යාලයේ දී ය.

වර්ෂ 1973 ක්වූ මාර්තු මස 21 වැනි දින අම්බලන්ගොඩ දී මා ඉදිරිපිට සහතික කරන ලදී.

කේ. ඩී. ප්‍රනාන්දු,
සාමදාන විනිශ්චයකාර.

## අම්බලන්ගොඩ නගරය

### 1972 වර්ෂයට ලැබීම් හා ගෙවීම් පිළිබඳ වාර්තාව

**ලැබීම්**

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය අය ... ... | 3,53,992 92 | |
| බී.—මංමාවත් ... ... | — | |
| සී.—තානායම් සහ අම්බලම් ... | 26,127 64 | |
| ඩී.—නගර සභා ඉඩම්, ගොඩනැගිලි ... | 29,198 35 | |
| ඊ.—මහජන සෞඛ්‍යය ... ... | 60,343 90 | |
| එෆ්.—මහජන ක්‍රීඩා ... ... | 65,713 65 | |
| ජී.—සොහොන් බිම් ... ... | — | |
| එච්.—සුනඛයින් ලියාපදිංචි කිරීම ... | 50 0 | |
| ඇම්.—කියවීම් ශාලා හා පුස්තකාල ... | 854 85 | |
| ඊ.ඩී.—විදුලි දෙපාර්තමේන්තුව ... | 4,06,197 69 | |
| | | 9,42,479 0 |
| **වෙනත් ලැබීම්** | | |
| තැන්පත් මුදල් ... ... | 97,024 68 | |
| අත්තිකාරම් මුදල් ... ... | 23,354 32 | |
| විවිධ ණය ගැතියෝ ... ... | 11,061 90 | |
| රජයේ ආධාර (තානායම) ... | 25,000 0 | |
| වැඩිපුර ගෙවීම් ආපසු ලබා ගැනීම් ... | 682 20 | |
| එම මුඩුක්කු සංහාරක නිවාස යෝ. ක්‍ර. | 12,000 0 | |
| | | 1,69,123 10 |
| | | 11,11,602 10 |
| 1972.01.01 දිනට ශේෂය ... | | 64,463 01 |
| | | 11,76,065 11 |

**ගෙවීම්**

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වැය ... ... | 1,18,216 99 | |
| බී.—මංමාවත් ... ... | 99,923 13 | |
| සී.—තානායම් සහ අම්බලම් .... | 16,450 27 | |
| ඩී.—නගර සභා ඉඩම්, ගොඩනැගිලි ... | 50,600 15 | |
| ඊ.—මහජන සෞඛ්‍යය ... ... | 1,49,767 94 | |
| එෆ්.—මහජන ක්‍රීඩා ... ... | 2,186 20 | |
| ජී.—සොහොන් බිම් ... ... | 2,584 15 | |
| එච්.—සුනඛයින් ලියාපදිංචි කිරීම ... | 70 0 | |
| කේ.—ගින්නෙන් ප්‍රවේශම ... | 314 96 | |
| ඇම්.—කියවීම් ශාලා හා පුස්තකාල ... | 13,520 85 | |
| ඊ.ඩී.—විදුලි දෙපාර්තමේන්තුව ... | 2,38,458 04 | |
| | | 6,92,092 68 |
| **වෙනත් ගෙවීම්** | | |
| තැන්පත් මුදල් ... ... | 70,375 55 | |
| අත්තිකාරම් ... ... | 67,211 68 | |
| විවිධ ණය හිමියෝ ... ... | 38,245 25 | |
| ගබඩා අත්තිකාරම් ගිණුම ... | 85,158 38 | |
| ධීවර නිවාස ක්‍රමය—රජයේ ආධාර ... | 4,465 0 | |
| ධීවර පාරවල්—රජයේ ආධාර ... | 934 21 | |
| රජයේ ආධාර (තානායම) ... | 8,280 85 | |
| එම මුඩුක්කු සංහාරක නිවාස යෝ. ක්‍රමය | 33,300 0 | |
| | | 3,07,970 92 |
| | | 10,00,063 60 |
| 1972.12.31 දිනට ශේෂය ... | | 1,76,001 51 |
| | | 11,76,065 11 |

අම්බලන්ගොඩ නගරයේ විශේෂ කොමසාරිස් කෝලිත වල්ගමගේ වන මම ඉහත කී වාර්තාව මාගේ උපරිම දැනීමේ හා විශ්වාසයේ හැටියට අම්බලන්ගොඩ නගරය වෙනුවෙන් 1972 වර්ෂය තුල ලබන ලද හා ගෙවන ලද මුදල් පිළිබඳව සැබෑ හා නිවැරදි වාර්තාවක් බවට මෙයින් සහතික කරමි.

ඉහත කී වාර්තාව නිවැරදි බවට සහතික කරමි.
එල්. එච්. එල්. රණසූරිය,
ලේකම්.

කේ. වල්ගමගේ,
විශේෂ කොමසාරිස්,අම්බලන්ගොඩ නගරය.

අම්බලන්ගොඩ විශේෂ කොමසාරිස් කාර්‍යාලයේ දී ය.

වර්ෂ 1973 ක්වූ මාර්තු මස 21 වනදින අම්බලන්ගොඩ දී මා ඉදිරිපිට සහතික කරන ලදී.

කේ. ඩී. ප්‍රනාන්දු,
සාමදාන විනිශ්චයකාර.

6–473—73.06.14 දින අංක 64 දරණ ගැසට් පත්‍රය

**විශේෂ කොමසාරිස් කාර්‍යාලයය—පුස්සැල්ලාව**

1972 දෙසැම්බර් මස 31 දිනට වත්කම් හා බැරකම් ප්‍රකාශය

බැරකම්

| | | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|
| තැන්පත් | ... | | 47,888 94 |
| රජයේ ආධාර : නිවාස යෝජනා ක්‍රමය | ... | 21,231 50 | |
| පැති කාණු | ... | 2,000 0 | |
| පාරවල් | ... | 4,897 17 | |
| | | | 28,128 67 |
| ණය මුදල් : නිවාස යෝජනා ක්‍රමය | ... | 561 55 | |
| විදුලිය යෝජනා ක්‍රමය | ... | 1,650 46 | |
| | | | 2,212 01 |
| විදුලිය ක්ෂය සංචිත ගිණුම | ... | | 11,800 0 |
| විවිධ ණය හිමි ගිණුම ... | ... | | 47,226 12 |
| **අධිකතා හා ඌණතා ගිණුම (සාමාන්‍ය)** | | | |
| 1972.01.01 දිනට අධිකය | ... | 97,580 02 | |
| 1972.12.31 දිනට ගැලපීම් | ... | 454 53 | |
| 1972.12.31 දිනට ආදයම | ... | 1,77,154 53 | |
| | | 2,75,189 08 | |
| 1972.12.31 දිනට වියදම | ... | 1,50,391 87 | |
| | | | 1,24,797 21 |
| **අධිකතා හා ඌණතා ගිණුම (විදුලිය)** | | | |
| 1972.01.01 දිනට අධිකය | ... | 4,622 86 | |
| 1972.12.31 දිනට ආදයම | ... | 78,444 39 | |
| | | 83,067 25 | |
| 1972.12.31 දිනට වියදම | ... | 69,555 21 | |
| | | | 13,512 04 |
| | | | 2,75,564 99 |

වත්කම්

| | | | රු. ශ. |
|---|---|---|---|
| අත්තිකාරම් ... | ... | ... | 3,268 06 |
| දේපල බදු එකතු කිරීමේ ගිණුම | ... | ... | 21,729 19 |
| කසළ බදු එකතු කිරීමේ ගිණුම | ... | ... | 11,904 96 |
| විදුලිය ගාස්තු එකතු කිරීමේ ගිණුම | ... | ... | 21,714 22 |
| බදු හා කුලී එකතු කිරීමේ ගිණුම | ... | ... | 13,122 31 |
| ජල බදු එකතු කිරීමේ ගිණුම | ... | ... | 17,726 77 |
| වරෙන්තු ගාස්තු එකතු කිරීමේ ගිණුම | ... | ... | 3,188 06 |
| පෞද්ගලික ජල සේවා ගාස්තු | ... | ... | 378 0 |
| විවිධ ණය ගැති ගිණුම ... | ... | ... | 52,465 37 |
| ස්ථිර තැන්පත් ගිණුම ... | ... | ... | 86,140 40 |
| 1972.12.31 දිනට මුදල් පොතේ ශේෂය | ... | ... | 43,917 65 |
| මු.පො. අංක 40/20.05.71 යටතේ අධිකය | | ... | 10 0 |
| | | | 2,75,564 99 |

පුස්සැල්ලාව විශේෂ කොමසාරිස් කාර්‍යාලයේ, විශේෂ කොමසාරිස්, මුතුබණ්ඩා සමරකෝන් වන මම, ඉහත සඳහන් වාර්තාව, මගේ සම්පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට පුස්සැල්ලාව විශේෂ කොමසාරිස් කාර්‍යාලයේ 1972 දෙසැම්බර් මස 31 දිනට වත්කම් හා බැරකම් පිළිබඳ සත්‍යවූත්, නිවැරදි වූත් වාර්තාවක් බවට සහතික කරමි.

ඇම්. බී. සමරකෝන්,<br>
විශේෂ කොමසාරිස්, පුස්සැල්ලාව නගරය.

1973 පෙබරවාරි මය 28 වැනි දින,<br>
පුස්සැල්ලාව,<br>
විශේෂ කොමසාරිස් කාර්‍යාලයේ දී ය.

1973 පෙබරවාරි මය විසිඅට වැනි දින මහනුවර දී, මා ඉදිරිපිට දී අත්සන් කරන ලදි.

එල්. ඕ. කේ. පෙරේරා,<br>
සුප්‍රිම් උසාවියේ නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස්, සාමදාන<br>
විනිශ්චයකාර සහ නිළ නොලත් මහේස්ත්‍රාත්, මහනුවර.

**පුස්සැල්ලාව විශේෂ කොමසාරිස් කාර්‍යාලයය**

1972 වර්ෂයේ ආදයම් හා වියදම් පිළිබඳ ප්‍රකාශණය

ආදයම

| | | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|
| ඒ.—සාමාන්‍ය ආදයම ... | ... | 1,20,538 46 | |
| බී.—මංමාවත් ... | ... | 1,326 96 | |
| සී.—සභා ඉඩම් සහ ගොඩනැගිලි | ... | 8,236 44 | |
| ඩී.—මහජන සෞඛ්‍යය ... | ... | 41,984 77 | |
| ඊ.—මහජන විනෝදය ... | ... | 4,913 90 | |
| එෆ්.—සුසාන භූමි ... | ... | 100 0 | |
| ජී.—සුනඛයින් ලියාපදිංචි කිරීම | ... | 14 0 | |
| | | | 1,77,154 53 |
| වෙනත් ආදයම් :— | | | |
| තැන්පත් ... | ... | 21,466 32 | |
| අත්තිකාරම් ... | ... | 12,717 22 | |
| විදුලිය ගිණුම ... | ... | 78,444 39 | |
| විදුලිය ක්ෂය සංචිත ගිණුම | ... | 1,000 0 | |
| | | | 1,13,627 93 |
| ආදයම් රැස් කිරීමේ ගිණුම :— | | | |
| දේපල බදු ... | ... | 8,186 82 | |
| කසළ බදු ... | ... | 5,400 98 | |
| විදුලිය ගාස්තු ... | ... | 51,382 43 | |
| බදු හා කුලී ... | ... | 26,933 94 | |
| ජල බදු ... | ... | 7,163 65 | |
| වරෙන්තු ගාස්තු ... | ... | 1,057 08 | |
| පෞද්ගලික ජල සේවා ගාස්තු | ... | 2,142 0 | |
| | | | 1,03,266 90 |
| විවිධ ණය ගැති ගිණුම ... | ... | | 441 0 |
| විවිධ ණය හිමි ගිණුම ... | ... | | 23,182 78 |
| 1971.12.31 දිනට මුදල් පොතේ ශේෂය | ... | | 70,420 79 |
| අධිකතා හා ඌණතා ගිණුම (සාමාන්‍ය) | ... | | 454 53 |
| | | | 4,88,548 46 |

වියදම

| | | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම ... | ... | 43,109 08 | |
| බී.—මංමාවත් ... | ... | 12,883 12 | |
| සී.—සභා ඉඩම් සහ ගොඩනැගිලි | ... | 8,752 24 | |
| ඩී.—මහජන සෞඛ්‍යය ... | ... | 1,59,492 43 | |
| ඊ.—මහජන විනෝදය ... | ... | 25,905 0 | |
| එෆ්.—සුසාන භූමි ... | ... | — | |
| ජී.—සුනඛයින් ලියාපදිංචි කිරීම | ... | 250 0 | |
| | | | 1,50,391 87 |
| වෙනත් වියදම් :— | | | |
| තැන්පත් ... | ... | 20,384 30 | |
| අත්තිකාරම් ... | ... | 11,543 28 | |
| විදුලිය ගිණුම ... | ... | 69,555 21 | |
| ස්ථිර තැන්පත් ගිණුම ... | ... | 1,620 32 | |
| | | | 1,03,103 11 |
| ආදයම් රැස් කිරීමේ ගිණුම :— | | | |
| දේපල බදු ... | ... | 13,963 19 | |
| කසළ බදු ... | ... | 8,261 51 | |
| විදුලිය ගාස්තු ... | ... | 53,738 95 | |
| බදු හා කුලී ... | ... | 26,683 82 | |
| ජල බදු ... | ... | 11,047 88 | |
| වරෙන්තු ගාස්තු ... | ... | 2,063 45 | |
| පෞද්ගලික ජල සේවා ගාස්තු | ... | 2,502 0 | |
| | | | 1,18,260 80 |
| විවිධ ණය ගැති ගිණුම ... | ... | | 55,514 09 |
| විවිධ ණය හිමි ගිණුම ... | ... | | 16,823 85 |
| 1972.12.31 දිනට මුදල් පොතේ ශේෂය | ... | | 43,917 65 |
| රජයේ ආධාර—නිවාස යෝජනා ක්‍රමය | ... | | 537 09 |
| | | | 4,88,548 46 |

පුස්සැල්ලාව විශේෂ කොමසාරිස් කාර්‍යාලයේ, විශේෂ කොමසාරිස්, මුතුබණ්ඩා සමරකෝන් වන මම, ඉහත සඳහන් වාර්තාව, මගේ සම්පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට 1972 වර්ෂයට, පුස්සැල්ලාව විශේෂ කොමසාරිස් කාර්‍යාලයේ ආදායම් හා වියදම් පිළිබඳ සත්‍යවූත්, නිවැරදිවූත් වාර්තාවක් බවට සහතික කරමි.

ඇම්. බී. සමරකෝන්,
විශේෂ කොමසාරිස්, පුස්සැල්ලාව නගරය.

1973 පෙබරවාරි මස 28 වැනි දින,
පුස්සැල්ලාව,
විශේෂ කොමසාරිස් කාර්‍යාලයේ දී ය.

1973 පෙබරවාරි මස 28 වැනි දින මහනුවර දී, මා ඉදිරිපිට දී අත්සන් කරන ලදී.

එල්. ඕ. කේ. පෙරේරා,
සාමදාන විනිශ්චයකාර සහ නිළ නොලත් මහේස්ත්‍රාත්,
සුප්‍රීම් උසාවියේ නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස්, මහනුවර.

6–454—73.06.14 දින අංක 64 දරණ ගැසට් පත්‍රය

---

මාතර නගරය

1972 දෙසැම්බර් මස 31 වැනි දිනට මාතර නගරයේ ආදායම් හා වියදම් ගිණුම (සාමාන්‍ය)

| වියදම් | රු. ශ. | ආදායම් | රු. ශ. |
|---|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් ... ... ... | 3,08,335 58 | ඒ.—සාමාන්‍ය වියදම් ... ... ... | 10,27,827 96 |
| බී.—මහා මාර්ග ... ... ... | 3,47,562 08 | බී.—මහා මාර්ග ... ... ... | 12,776 51 |
| සී.—තානායම් හා අම්බලම් ... ... | 13,185 84 | සී.—තානායම් හා අම්බලම් ... ... | 17,747 17 |
| ඩී.—නගර සහා ඉඩම් හා ගොඩනැගිලි ... ... | 48,187 24 | ඩී.—නගර සහා ඉඩම් හා ගොඩනැගිලි ... | 58,567 60 |
| ඊ.—සනීපාරක්ෂාව ... ... ... | 8,35,173 13 | ඊ.—සනීපාරක්ෂාව ... ... ... | 1,74,224 38 |
| එෆ්.—මහජන විනෝදය ... ... ... | 4,587 20 | එෆ්.—මහජන විනෝදය ... ... | 87,957 50 |
| ජී.—සුසාන භූමි ... ... ... | 2,951 25 | ජී.—සුසාන භූමි ... ... ... | 4,006 0 |
| එච්.—බල්ලන් විනාශ කිරීම ... ... | 999 0 | එච්.—බල්ලන් ලියාපදිංචි කිරීම ... ... | 22 50 |
| අයි.—කිරුම් හා මිණුම් ... ... ... | 3,162 48 | අයි.—කිරුම් හා මිණුම් ... ... | 3,034 15 |
| එම්.—පුස්තකාල හා කියවීම් ශාලා ... ... | 24,885 59 | එම්.—පුස්තකාල හා කියවීම් ශාලා ... ... | 1,080 71 |
| සාමාන්‍ය ගිණුමින් විදුලිය ගිණුමට මාරු කිරීම ... | 57,099 26 | රජයේ දේපල ... ... ... | 12,989 40 |
| | | විදුලිය ගිණුමින් සාමාන්‍ය ගිණුමට මාරුකිරීම ... | 17,578 82 |
| | | ඌණතාවය ... ... ... | 2,28,315 95 |
| | 16,46,128 65 | | 16,46,128 65 |

ඉහත සඳහන් ආදායම් හා වියදම් ගිණුම මවිසින් පරීක්ෂා කළ බවත්, එය නිවැරදි බවත් සහතික කරමි.

ඩබ්ලිව්. ඩබ්ලිව්. කිව්. පී. ප්‍රනාන්දු,
ගණකාධිකාරී, මාතර නගරය.

ඒ. ඊ. බුල්ජන්ස්,
විශේෂ කොමසාරිස්, මාතර නගරය.

ඒ. ජී. යසානන්ද,
ලේකම්, මාතර නගරය.

1973 මැයි මස 30 වැනි දින මා ඉදිරිපිට දී සහතික කරන ලදී.

එච්. ඊ. ගෞරවපාල,
සමාදාන විනිශ්චයකාර තැන.

1973 මැයි මස 30 වැනි දින,
මාතර නගරයේ විශේෂ කොමසාරිස් කාර්‍යාලයේ දී ය.

1972 දෙසැම්බර් මස 31 වැනි දිනට මාතර නගරයේ ආදායම් හා වියදම් පිළිබඳ ගිණුම (විදුලිය)

| වියදම් | රු. ශ. | ආදායම | රු. ශ. |
|---|---|---|---|
| ජේ.—විදුලිය වියදම් ... ... ... | 9,97,649 59 | ජේ.—විදුලිය ආදායම් ... ... ... | 11,44,823 74 |
| විදුලිය ගිණුමින් සාමාන්‍ය ගිණුමට මාරු කිරීම ... | 17,578 82 | සාමාන්‍ය ගිණුමින් විදුලිය ගිණුමට මාරුකිරීම ... | 57,099 26 |
| අධිකය ... ... ... | 1,86,694 59 | | |
| | 12,01,923 0 | | 12,01,923 0 |

ඉහත සඳහන් ආදායම් හා වියදම් ගිණුම මවිසින් පරීක්ෂා කළ බවත්, එය නිවැරදි බවත් සහතික කරමි.

ඩබ්. ඩබ්. කිව්. පී. ප්‍රනාන්දු,
ගණකාධිකාරී,
මාතර නගරය.

ඒ. ඊ. බුල්ජන්ස්,
විශේෂ කොමසාරිස්,
මාතර නගරය.

ඒ. ජී. යසානන්ද,
ලේකම්,
මාතර නගරය.

1973 මැයි මස 30 වැනි දින මා ඉදිරිපිටදී සහතික කරන ලදී.

එච්. ඊ. ගෞරවපාල,
සමාදාන විනිශ්චයකාර තැන.

1973 මැයි මස 30 වැනි දින,
මාතර නගරයේ විශේෂ කොමසාරිස් කාර්යාලයේදී ය.

## නිශ්චල වත්කම් ලේඛනය

| දිනය | ඉඩමේ හෝ ගොඩනැගිල්ලේ විස්තර | වටිනාකම රු. | ශ. |
|---|---|---|---|
| — | දනවත්ත නිවාස යෝජනා ක්‍රමය (ගෙවල් 16 කි) | 40,000 | 0 |
| — | ආවාසවත්ත නිවාස යෝජනා ක්‍රමය (ගෙවල් 18 කි) | 45,000 | 0 |
| — | ''ජුනුස්'' නිවාස යෝජනා ක්‍රමය (ගෙවල් 20 කි) | 70,000 | 0 |
| — | වැල්ලවත්ත නිවාස යෝජනා ක්‍රමය (ගෙවල් 25 කි) | 75,000 | 0 |
| — | කොප්පරාවත්ත නිවාස යෝජනා ක්‍රමය (ගෙවල් 70 කි) | 2,45,000 | 0 |
| — | කාලිදස නිවාස යෝජනා ක්‍රමය (ගෙවල් 20 කි) | 70,000 | 0 |
| — | දුම්රිය පොළ පාරේ ආයුර්වේද බෙහෙත් ශාලාව | 20,000 | 0 |
| — | කොටුවේගොඩ ආයුර්වේද බෙහෙත් ශාලාව | 15,000 | 0 |
| — | තානායම | 75,000 | 0 |
| — | කර්මාන්ත අධිකාරිගේ නිවාසය සහ අවට ඉඩම | 1,25,000 | 0 |
| — | නගර සභා කාර්යාලය සහ ඉඩම | 1,40,000 | 0 |
| — | නූපේ ප්‍රසිද්ධ වෙළඳ පොල, කඩ බක්කි සහ අවට ඉඩම | 40,000 | 0 |
| — | කොටුවේගොඩ ප්‍රසිද්ධ වෙළඳ පොල | 60,000 | 0 |
| — | කොටුවේගොඩ මාළු වෙළඳ පොළ, කඩ බක්කි ඇතුලුව | 14,000 | 0 |
| — | බතුතා පාර ප්‍රසිද්ධ වෙළඳ පොල සහ කඩ බක්කි | 25,000 | 0 |
| — | පරණ තංගල්ල පාරේ පදික වේදිකා කඩ | 7,500 | 0 |
| — | නගර සභා කාර්යාලය ඉදිරිපිට ඇති දෙඩම් වෙළඳ සැල් | 5,000 | 0 |
| — | ''ලකී ස්ටෝර්ස්'' | 20,000 | 0 |
| — | ''රිච්මන්ඩ් කැෆේ'' | 25,000 | 0 |
| — | වෙළඳ පොල පාරේ පිහිටි කඩ සාප්පු පෙල | 1,75,000 | 0 |
| — | මැද්දවත්ත වඩු කාර්මික පාසැල පිහිටි ඉඩම | 16,000 | 0 |
| — | රාහුල පාරේ ප්‍රසිද්ධ සුසාන භූමිය | 80,000 | 0 |
| | උයන්වත්ත ක්‍රීඩා භූමිය | 1,50,000 | 0 |
| — | කොටුවේගොඩ ක්‍රීඩා භූමිය | 75,000 | 0 |
| — | පොල්හේන කැළිකසළ ගොඩ කරන ඉඩම | 50,000 | 0 |
| — | මැද්දෙවත්තේ සහ පරණ තංගල්ල පාරේ පිහිටි ඉඩම | 1,00,000 | 0 |
| — | පන්සල ඉදිරිපිට ඇති ත්‍රිකෝණාකාර බිම් කැබැල්ල | 15,000 | 0 |
| | එකතුව | 17,77,500 | 0 |

ඉහත සඳහන් වනුයේ නගර සභාව සතු නිශ්චල වත්කම් පිළිබඳ නඩත්තු කෙරෙන ලේඛනයේ පිටපතක් බව මෙයින් සහතික කරමි.

ඩබ්. ඩබ්. කිව්. පී. ප්‍රනාන්දු,
ගණකාධිකාරී,
මාතර නගරය.

ඒ. ඊ. බුල්ජන්ස්,
විශේෂ කොමසාරිස්,
මාතර නගරය,

1973 මැයි මස 30 වැනි දින

## 1972 දෙසැම්බර් මස 31 වැනි දිනට මාතර නගරයේ ශේෂ පත්‍රය

| බැරකම් | සාමාන්‍ය රු. ශ. | විදුලිය රු. ශ. | එකතුව රු. ශ. |
|---|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම | 2,05,424 75 | 87,510 0 | 2,92,934 75 |
| දීර්ඝකාලීන වගකීම් | | | |
| දේශීය ණය සංවර්ධන අරමුදලේ ණය | 3,45,375 0 | 1,50,000 0 | 4,95,375 0 |
| ජංගම වගකීම් | | | |
| අධ්‍යක්ෂක ජල සම්පාදන හා ජලාපවාහන දෙපාර්තමේන්තුව | 13,93,354 80 | — | 13,93,354 80 |
| ලං. වී. ම. | — | 1,19,616 0 | 1,19,616 0 |
| ණය හිමියෝ | 3,31,087 54 | 45,101 85 | 3,76,189 39 |
| තැන්පත් | 3,46,952 38 | 3,83,123 67 | 7,30,076 05 |
| වැය කිරීමට ඇති ආධාර මුදල් | 1,83,231 96 | — | 1,83,231 96 |
| සංචිත | 6,000 0 | 10,837 76 | 16,837 76 |
| අධිකය | — | 1,42,239 12 | 1,42,239 12 |
| | 28,11,426 43 | 9,38,428 40 | 37,49,854 83 |

| වත්කම් | සාමාන්‍ය රු. ශ. | විදුලිය රු. ශ. | එකතුව රු. ශ. |
|---|---|---|---|
| ප්‍රාග්ධන වත්කම් | | | |
| රථවාහන | 76,500 0 | 25,000 0 | 1,01,500 0 |
| යන්ත්‍රසූත්‍ර | 36,250 0 | — | 36,250 0 |
| ලී බඩු හා උපකරණ | 1,04,084 75 | 21,938 0 | 1,26,022 75 |
| ණය යෙදුම් | 2,21,249 17 | 1,21,984 41 | 3,43,233 58 |
| ආයෝජන | | | |
| ස්ථිර තැන්පත් | 5,16,888 10 | 15,000 0 | 5,31,888 10 |
| ජංගම වත්කම් | | | |
| හිඟ ආදයම් | | | |
| වරිපනම් බදු | 2,32,537 07 | — | 2,32,537 07 |
| තහනම් ගාස්තු | 21,813 13 | — | 21,813 13 |
| කුලී | 21,761 97 | — | 21,761 97 |
| ජලබදු | 9,827 72 | — | 9,827 72 |
| රජයේ දේපල | 30,817 90 | — | 30,817 90 |
| විදුලිය ගාස්තු | — | 2,99,281 22 | 2,99,281 22 |
| අත්තිකාරම් | 1,57,427 18 | 5,880 19 | 1,63,307 37 |
| ගබඩා අත්තිකාරම් | 41,022 48 | 2,67,727 85 | 3,08,750 33 |
| ණයගැතියෝ | 3,12,083 51 | 89,483 0 | 4,01,566 51 |
| මුදල් | 69,939 77 | 92,133 73 | 1,62,073 50 |
| ඌණතාවය | 9,59,223 68 | — | 9,59,223 68 |
| | 28,11,426 43 | 9,38,428 40 | 37,49,854 83 |

ඉහත සඳහන් ශේෂ පත්‍රය මවිසින් පරීක්ෂා කළ බවත් එය නිවැරදි බවත් සහතික කරමි.

ඩබ්ලිව්.ඩබ්ලිව්. කිව්. පී. ප්‍රනාන්දු,
ගණකාධිකාරී,
මාතර නගරය.

ඒ. ජී. යසානන්ද,
ලේකම්,
මාතර නගරය.

ඒ. ඊ. බුල්ජන්ස්,
විශේෂ කොමසාරිස්,
මාතර නගරය.

1973 මැයි මස 30 වැනි දින මා ඉදිරිපිටදී සහතික කරන ලදී.

එච්. ඊ. ගෞරවපාල,
සමාදාන විනිශ්චයකාර තැන.

1973 මැයි මස 30 වැනි දින,
මාතර නගරයේ විශේෂ කොමසාරිස් කාර්යාලයේ දී ය.

6-474—73.06.14 දින අංක 64 දරන ගැසට් පත්‍රය

# අය - වැය ලේඛන

## වරකාපොල සුළු නගර සභාව

මුදල් රෙගුලාසි අංක 40 (11) යටතේ අයදුම්පත්‍රය අංක 2

**අය-වැය ලේඛණය 1973 සාමාන්‍ය අංශය**

| මුදල් ඉතිරිවන වැය ශීර්ෂ | රු. ශ. | මුදල් අවශ්‍යවන වැය ශීර්ෂ | රු. ශ. |
|---|---|---|---|
| ඒ.—සාමාන්‍ය | | ඩී.—සෞඛ්‍යාරක්ෂාව | |
| 1. සේවකයින්ගේ වැටුප් | | 1. සාමාන්‍ය | |
| (ඒ) ලේකම් ... ... ... | 450 0 | (එච්) කාණු ඉදිකිරීම ... ... ... | 500 0 |
| ඩී.—සෞඛ්‍යාරක්ෂාව | | (එන්) මාතෘ නිවාසය හා දරුකාභි වෘධි නිවාසය ... | 450 0 |
| 6. ආරෝග්‍යශාල | | | |
| (බි) නඩත්තු කිරිම ... ... ... | 755 0 | 4. සත්ව ඝාතන ස්ථානය හා ගව ළිඳුව | |
| | | (සී) අත්පත් කර ගැනිම ... ... ... | 255 0 |
| | 1,205 0 | | 1,205 0 |

ඉහත දක්වෙන පරිදි ඒ ඒ ශීර්ෂයන් යටතේ ඉතිරිවේයයි ගණන් බලනලද මුදල් ඊට අනුරූපව දක්වෙන වෙනත් වැය ශීර්ෂයන් යටතේ වැඩිපුර වැය කිරිමට ඇති මුදල් පියවා ගැණිම සඳහා 1973 අය-වැය ලේඛනයේ (සාමාන්‍ය) වෙනස්කම් කිරීමට 1973.05.26 දින අංක 7 (2) යෝජනයෙන් වරකාපොල සුලු නගර සභාව විසින් තීරණය කරන ලදී.

ඩබ්ලිව්. ඒ. ඇල්බට්,
සභාපති,
වරකාපොල සුළු නගර සභාව.

සුළු නගර සභා කා:ර්යාලයේ දීය,
වරකාපොල, 29.05.1973.

අනුමත කරමි.

පැරකුම් විජේසිංහ,
කෑගල්ල පළාත් පාලන සහකාර කොමසාරිස්.

1973 ජුනි මස 1 දින,
කෑගල්ල පළාත් පාලන අමාත්‍යංශ කාර්යාලයේ දීය.

6-451—73.06.14 දින අංක 64 දරණ ගැසට් පත්‍රය

---

## දෙහිඕවිට සුළු නගර සභාව

සුළු නගරසභා මුදල් රෙගුලාසි 40 (11) යටතේ අයදුම්පත

**1973 අය වැය ලේඛනය**

1973 අය වැය ලේඛනයේ ඒ ඒ වැය ශීර්ෂයන් යටතේ වෙන් කරන ලද මුදල් වලින් ඉතිරිවේයයි ගණන් බලන ලද මුදල්, ඊට අනුරූපව ඇති අතිරේක ප්‍රතිපාදන අවශ්‍ය වේයයි ගණන් බලා ඇති වැය ශීර්ෂ වලට මාරු කර වියදම් කිරීමට තීරණය කරන ලදී.

| මුදල් ඉතිරි වැය ශීර්ෂ | ඉතිරි මුදල රු. ශ. | මුදල් අවශ්‍ය වැය ශීර්ෂ | අවශ්‍ය මුදල රු. ශ |
|---|---|---|---|
| ඒ.—2 (ඩී) තක්සේරු ගාස්තු ... ... | 1,100 0 | ඒ.—3 ආපසු ගෙවීම් ... ... | 100 0 |
| ඩී.—(3) (ඒ) වේතන ... ... ... | 290 0 | ඩී.—3 (ඊ) වැසිකිලි නඩත්තුව ... ... | 290 0 |
| ඒ.—2 (ජී) වාහන තහඩු ... ... | 200 0 | බී.—2 මාර්ග නඩත්තුව ... ... | 1,200 0 |
| එකතුව .. | 1,590 0 | එකතුව .. | 1,590 0 |

පැරකුම් විජේසිංහ,
පාලන නිලධාරි, දෙහිඕවිට සුළු නගර සභාව.

1973 මැයි මස 29 දින,
දෙහිඕවිට සුළු නගර සභා කාර්‍යාලයේ දිය.

අනුමත කරමි.

පැරකුම් විජේසිංහ,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
කෑගල්ල.

1973 ජුනි මස 01 වෙනි දින
කෑගල්ලේ පළාත් පාලන කාර්‍යාලයේදීය.

6-441—73.06.14 දින අංක 64 දරණ ගැසට් පත්‍රය

# විවිධ දැන්වීම්

## කඳාන නගරය

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් අය ඒ ඉදිරියෙන් දක්වා ඇති ස්ථානයේ 1973 ජූනි 01 වන දින සිට 1973 දෙසැම්බර් 31 දින දක්වා මස් විකිණීමට ගෝඝාතක බල පත්‍රයක් ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බලපත්‍රය නිකුත් කිරීමට විරුද්ධව කඳාන නගර සීමාව ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන කරුණු සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 7 ක් ඇතුළත මාවෙත එවිය යුතු බව ගෝඝාතක ආඥාපනතේ 272 වන අධිකාරියේ අංක 7 (2) දරණ වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

බී. එන්. එෆ්. මෙන්දිස්,
විශේෂ කොමසාරිස්,
කඳාන නගරය.

1973 ක්වූ මැයි මස 31 වෙනි දින,
කඳාන නගරයේ,
විශේෂ කොමසාරිස් කාර්යාලයේ දී ය.

#### උපලේඛනය

| ඉල්ලුම්කරු | ස්ථානය හා වෙළඳාමේ ස්වභාව |
|---|---|
| ඩේවිඩ් ජයසිංහ ... | කඳාන ප්‍රසිද්ධ වෙළඳ පොළ අංක 3 දරණ මස් කඩය. |

6-497—73. 06. 14 දින අංක 64 දරණ ගැසට් පත්‍රය

---

## අළුත්ගම සුළු නගර සභාව

### 1973 වර්ෂයේ වරිපනම් ලේඛන

1973 වර්ෂය සඳහා වූ මෙම සුළු නගර සභාවේ වරිපනම් ලේඛන දැනට සූදානම්ව ඇති බවත්, එම ලේඛන කාර්යාලයීය වේලාවන්හිදී මෙම කාර්යාලයේදී බදු ගෙවන්නන් විසින් පරීක්ෂා කර බැලීම සඳහා තබා ඇති බවත්, (256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 165 වැනි වගන්තියේ කියවෙන පරිදි 252 වැනි අධිකාරය වූ මහ නගර සභා ආඥාපනතේ අංක 235 (1) සහ (2) දරණ වගන්ති අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ජී. ඇල්. වියුබර් ද සිල්වා,
සභාපති,
අළුත්ගම සුළු නගර සභාව.

1973 පෙබරවාරි 07 දින,
අළුත්ගම සුළු නගර සභා කාර්යාලයේ දී ය.

6-624—73. 06. 14 දින අංක 64 දරණ ගැසට් පත්‍රය

---

## අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලය

### වරිපනම් ලේඛන—1973

1973 වර්ෂයට අදාල වරිපනම් ලේඛන දැනට සකස් කර ඇති බවත්, ඒවා කාර්යාල වේලාවන් තුල අනුරාධපුර සංරක්ෂණ මණ්ඩල කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැකි බවත්, බදු ගෙවන්නන්ට මින් නිවේදනය කරනු ලැබේ.

කේ. ඒ. ධම්කීර්ති,
අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී.

1973 ජූනි මස 5 වැනි දින,
අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ දීය.

6-639/1—73. 06. 14 දින අංක 64 දරණ ගැසට් පත්‍රය

---

## අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලය

### 1961 අංක 32 දරණ අනුරාධපුර සංරක්ෂණ මණ්ඩල ආඥාපනත

### 1973 වර්ෂයේ වරිපනම් බදු

1961 අංක 32 දරණ අනුරාධපුර සංරක්ෂණ මණ්ඩල පනතේ 19 වැනි වගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමන්ගේ අනුමැතිය පරිදි 1973 වර්ෂය සඳහා පහත දැක්වෙන අයුරු වරිපනම් බදු පනවා ඇත :—

1. සියළුම නිශ්චල දේපලවලින් සියයට 15 ක ඒකාබද්ධ බද්දක් සහ කුඹුරු ඉඩම්වල වාර්ෂික වටිනාකමින් සියයට 10 ක බද්දක්,

(අ) අනුරාධපුර කලින් තිබුනු නගර සභාවෙන් පාලනය වූ පෙදෙස තුලත්,

(ආ) අනුරාධපුර පැරණි නගර සභා පාලන සීමාවට අයත් නොවූ අනුරාධපුර නව නගරයේ I වැනි පියවර තුලත්,

(ඇ) අනුරාධපුර නව නගරයේ II වැනි පියවර තුලත්,

2. මීහින්තලේ දියුණු ප්‍රදේශය තුල ඇති නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට 4ක ඒකාබද්ධ බද්දක් අයකරනු ලැබේ.

ඉහත සඳහන් බදු ගාස්තු පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 දිනයන්හි වාර 4 කින් ගෙවා නිමකළ යුතුය.

කේ. ඒ. ධම්කීර්ති,
අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී.

1973 ජූනි මස 5 වැනි දින
අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ දීය.

6-639/2—73. 06. 14 දින අංක 64 දරණ ගැසට් පත්‍රය

**පානදුර තල්පිටිබද්ද ගම්සභාවේ විදුලිය සැපයීමේ බලයලත් ප්‍රදේශ දීර්ඝ කිරීම සහ පානදුර නගර සභාවේ බලයලත් ප්‍රදේශ කෙටි කිරීම**

වර්ෂ 1950 අංක 19 දරණ විදුලිබල පනතේ 9 වැනි ඡේදය හා ඒ යටතේ වර්ෂ 1956 මාර්තු මස 2 වැනි දින අංක 10,899 දරණ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද නියෝගයන් ප්‍රකාර මා වෙත පැවරී ඇති බලතල අනුව සහ පානදුර තල්පිටිබද්ද ගම්සභාවට නිකුත් කර ඇති වර්ෂ 1966 ඔක්තෝබර් මස 29 වැනි දින දරණ විදුලිබල පත්‍රයේ "බී" උපලේඛනයෙන් සඳහන් විදුලිය සැපයීමේ බලය ලත් ප්‍රදේශය පහත දැක්වෙන පරිදි දීර්ඝ කිරීම සහ එම ප්‍රදේශය පානදුර නගර සභාවේ විදුලිබල පත්‍රයෙන් ඉවත් කිරීම පිළිබඳව ම විසින් බලය පවරනු ලබන නිළධාරියෙකු වර්ෂ 1973 ජූලි මස 5 වැනි දින පෙ. ව. 10 ට පානදුර නගර සභා කාර්යාලයේ දී විභාගයක් පවත්වනු ලබන බව සියළු දෙනාටම මෙයින් දැනුම් දෙනු ලැබේ.

දීර්ඝ කරනු ලබන සහ ඉවත් කරනු ලබන ප්‍රදේශය :—පානදුර නගර සභා සීමාවේ සිට පානදුර-හොරණ මාර්ගයේ සැතපුම් එකක (1) දුර ප්‍රමාණයක් වේ.

**මේ විභාගය සම්බන්ධව කරුණු ඉදිරිපත් කිරීමට කැමති සියළුම පුද්ගලයින් පිටපත් තුනකින් (3) සමන්විත එම කරුණු කවරයක බහා මුද්‍රා තබා ප්‍රධාන විදුලිය පරීක්ෂක, වාරිමාර්ග විදුලිය හා මහා මාර්ග අමාත්‍යාංශය, මහලේකම් කාර්යාලය, කොළඹ 1 යන ලිපිනය සඳහන් ලිපිය** වර්ෂ 1973 ජූනි මස 30 වැනි දින පෙරවරු 10 ට මත්තෙන් මාගේ කාර්යාලයට භාර දිය යුතුය. නැතහොත් ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

ඉහත සඳහන් කරුණ සම්බන්ධව වැඩිමනත් විස්තර සඳහා මේ දැන්වීමේ පළමුවැනි කොටසේ සඳහන් ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද නියෝගයන් බලනු මැනවි.

ජේ. ඇම්. යෝර්ක්,
ප්‍රධාන විදුලිය පරීක්ෂක.

පිටපත් :

සභාපති,
නගර සභාව, පානදුර.

සභාපති,
පානදුර තල්පිටිබද්ද ගම්සභාව,
පමුණුගම, අලුබෝමුල්ල.

6-435—73. 06. 14 දින අංක 64 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත සළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුයි. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයේ දැන්වීම ඇතුලත් වනවා හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙලින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පත්‍රයේ පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

### 1973

| මාසය | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|
| ජුනි ... | 73.06.01 | සිකුරාද | ... | 73.05.25 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.06.08 | සිකුරාද | ... | 73.06.01 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.06.14 | බ්‍රහස්පතින්ද | ... | 73.06.08 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.06.22 | සිකුරාද | ... | 73.06.14 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | 73.06.29 | සිකුරාද | ... | 73.06.22 | සිකුරාද | දවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.